දේවි බාලිකා විද්‍යාලය - කොළඹ 08

# Devi Balika Vidyalaya – Colombo 08

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 නොවැම්බර්, පළමු වාර පරීක්ෂණය

General Certificate of Education (Adv. Level) Examination November, 2018, 1st Term Test

නව නිර්දේශය
New Syllabus

ආර්ථික විද්‍යාව I
Economics I

21 | S | I

පැය දෙකයි
Two hours

13 ශ්‍රේණිය

විභාග අංකය .31

උපදෙස්:

- සියලු ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- අංක 01 සිට 50 තෙක් වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තෝරා එම අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.

1. පහත ප්‍රකාශ අතුරින් අභිමතානුකූල ප්‍රකාශය වන්නේ.
   (1) ආර්ථික විද්‍යාවට අනුව වෙළඳ පොළ, භාණ්ඩ වෙළඳ පොළ හා සාධක වෙළඳ පොළ ලෙස කොටස් දෙකකට වර්ග කෙරේ.
   (2) පාරිභෝගික ආදායම ඉහළ යන විට බාල භාණ්ඩ සඳහා පවතින ඉල්ලුමද ඉහළ යයි.
   (3) රටක ආදායම් ව්‍යාප්තියේ විෂමතා පැවතීම සාධාරණ නොවේ. .
   (4) අසීමිත මිනිස් වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් තරම් සම්පත් ආර්ථිකය සතුව නොමැත.
   (5) රටක යටිතල පහසුකම් වර්ධනය ජනතාවගේ ජීවන තත්වයේ ඉහළයාමකට හේතු වේ.

(.....3.....)

www.alsciencepapers.blogspot.com

2. ආර්ථික නොවන භාණ්ඩයක් යනු
   (1) සැපයුම පූර්ණ වශයෙන් අනම්‍ය භාණ්ඩයකි.
   (2) පාරිභෝගිකයාට ශූන්‍ය මිලකට සැපයෙන භාණ්ඩයකි.
   (3) ඇතැම් අවස්ථාවල රජය ද සපයනු ලබන භාණ්ඩයකි.
   (4) සෘජුවම භූමියෙන් උකහා ගන්නා භාණ්ඩයි.
   (5) නිෂ්පාදනයේදී හිඟ සම්පත් භාවිතා නොකරන භාණ්ඩයකි.

(.....5.....)

3. පරිගණක වැඩ සටහන් නිෂ්පාදනය කරනු ලබන සමාගමක පරිගණක මෘදුකාංග ඇතුළත් වනුයේ,
   (1) භෞතික ප්‍රාග්ධනය (2) සංසරණ ප්‍රාග්ධනය (3) මූල්‍ය ප්‍රාග්ධනය
   (4) සමාජ පොදුකාර්ය ප්‍රාග්ධනය (5) සමාජ ප්‍රාග්ධනය

(.....2.....)

4. නිදහස් ව්‍යවසාය යටතේ අදෘශ්‍යමාන හස්තය මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී . මුදුන් පමුණුවා ගත නොහැකි අරමුණ හඳුනාගන්න.
   (1) නිෂ්පාදකයාට සාපේක්ෂව වඩා ලාභදායි භාණ්ඩ නිපදවා ගැනීමට අදාලව සම්පත් බෙදා වෙන් කිරීම
   (2) අනපේක්ෂිත තොග සමුච්චනයන් ඉවත් කිරීම.
   (3) සාධාරණ ලෙස සමස්ත නිමැවුම කුටුම්භ වෙත බෙදා හැරීම තහවුරු කිරීම
   (4) ගැනුම්කරුවන්ගේ රුචීන්හි වෙනස්කම් ඇති වන විට ඒ පිළිබද සංඥා සැපයීම
   (5) සාපේක්ෂව පිරිවැය අවම වන ශිල්ප ක්‍රමය තෝරා ගැනීමට අදාල සංඥා සැපයීම.

(.....2.....)


5. ස්වාභාවික සම්පතක් වන වෙරළ නිසි පරිදි සංරක්ෂණය නොකිරීම නිසා ඛාදනයට පත් වීම නිෂ්පාදන හැකියා මායිමකින් දැක්වෙනුයේ,
   (1) හැකියා මායිම දකුණට විතැන් වීමක් ලෙසයි..
   (2) හැකියා මායිම වමට විතැන් වීමක් ලෙසයි.
   (3) හැකියා මායිම මත ලක්ෂයක් පහළට ගමන් කිරීමයි.
   (4) හැකියා මායිම මත පිහිටි ලක්ෂයක් මූලය දෙසට ගමන් කිරීමයි.
   (5) හැකියා මායිම ඇතුලත ලක්ෂයක කටයුතු කිරීමයි.

(.....2.....



Scanned by CamScanner

6. මූලික නිෂ්පාදන හැකියා ආදර්ශයේ "X" ලක්ෂයේ සිට නව හැකියා මායිමේ "Z" ලක්ෂය දක්වා චලනය වීමේ දී පෞද්ගලික භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය නිවැරදිව දැක්වෙනුයේ.
   (1) කාර්මික භාණ්ඩ ඒකක 60කි.
   (2) පෞද්ගලික භාණ්ඩ ඒකක 50කි.
   (3) කාර්මික භාණ්ඩ ඒකක 120කි.
   (4) කාර්මික භාණ්ඩ ඒකක 0කි.
   (5) කාර්මික භාණ්ඩ ඒකක 90 කි.




(............)

7. ඉල්ලුම් නීතිය අනුව භාණ්ඩයක මිල අඩු වන විට පාරිභෝගිකයින් මිලට ගන්නා ප්‍රමාණය වැඩි කෙරේ. මීට අදාළ වන්නේ,
   (1) මුළු උපයෝගිතාවය අඩු වන විට පරිභෝජනය කරන ප්‍රමාණය වැඩි කෙරේ.
   (2) ආන්තික උපයෝගිතාවය වැඩි වන විට භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් වීම.
   (3) ධන ආදායම් ප්‍රති විපාකය
   (4) පාරිභෝගික ඉල්ලුම් වක්‍රය මත ගමන් කිරීම. (............)
   (5) පාරිභෝගික ඉල්ලුම් වක්‍රය විතැන් වීම.

8. කිසියම් පාරිභෝගිකයෙකු භාණ්ඩයක වෙළඳපොළ මිල රු.16 දී ඒකක 80ක් මිල දී ගත් අතර භාණ්ඩ මිල රු.12 දක්වා අඩු වීම නිසා භාණ්ඩය සඳහා රු.1080ක් වැය කරන ලදී නම් භාණ්ඩයට ඇත්තේ,
   (1) නම්‍ය ඉල්ලුමකි. (2) අනම්‍ය ඉල්ලුමකි. (3) පූර්ණ අනම්‍ය ඉල්ලුමකි. (............)
   (4) ඒකීය නම්‍ය ඉල්ලුමකි. (5) පූර්ණ නම්‍ය ඉල්ලුමකි.

www.alsciencepapers.blogspot.com

9. කිසියම් භාණ්ඩයක් පවත්නා මිලක දී පමණක් මිලදී ගනු ලබයි නම් සහ ඉහළ මිලක දී ඉල්ලුම් නොකරයි නම්, භාණ්ඩයට ඇති ඉල්ලුම,
   (1) පූර්ණ අනම්‍ය වේ (2) පූර්ණ නම්‍ය වේ (3) ඒකීය නම්‍ය වේ. (............)
   (4) ඉතා අඩු නම්‍යතාවක් ගනී. (5) නම්‍යතාව ඉතා විශාල වේ.

10. එක්තරා භාණ්ඩයක සරල රේඛීය ඉල්ලුම් වක්‍රය $Qd = 100 - 4p$ වේ නම් මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව ඒකීය විය හැක්කේ,

| | මිල රු. | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| (1) | 8.00 | 40 |
| (2) | 4.50 | 60 |
| (3) | 10.50 | 35 |
| (4) | 12.50 | 50 |
| (5) | 15.00 | 10 |

(............)


11. කමිස සඳහා වන සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමට බලපාන සාධකයක් වන්නේ,
   (1) කමිස නිෂ්පාදනය සඳහා ආනයනය කරන රෙදි නිෂ්පාදනය මත පනවා තිබූ ආනයන බද්ද අඩු කිරීම.
   (2) කමිස නිෂ්පාදකයන්ගේ සංගමය විසින් සාර්ථක ප්‍රචාරක උපක්‍රම ක්‍රියාත්මක කිරීම
   (3) කලිසම් හා කමිස මිල ඉහළ යාම
   (4) කමිසවල විකුණුම් මිල ඉහළ යාම (............)
   (5) පාරිභෝගිකයින්ගේ ආදායම් වැඩි වීම



Scanned by CamScanner

12. භාණ්ඩයක් සඳහා පවතින වෙළඳ පොළ තත්වය පහත දැක්වේ.

www.alsciencepapers.blog




ප්‍රස්ථාර සටහනේ දක්වා ඇති සැපයුම් වක්‍රය $S_2$ සිට $S_1$ දක්වා විතැන්වීමට බලපෑ හැක්කේ පහත කුමන සාධකය ද?

(1) අදාල භාණ්ඩය නිෂ්පාදනයේ තාක්ෂණික පරිහානියක් සිදු වීම
(2) අදාල භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම
(3) අදාල භාණ්ඩය මත පනවා ඇති ඒකකයක අගය මත බදු වැඩි කිරීම.
(4) අදාල භාණ්ඩය සඳහා පවතින ඉල්ලුම පහළ යාම
(5) අදාල භාණ්ඩයේ නිෂ්පාදකයින්ට නිෂ්පාදන සහනාධාරයක් ලබාදීම. (..................)

13. කිසියම් භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් සැපයුම් ලේඛනය පහත දැක් වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය(ඒකක) | සැපයුම් ප්‍රමාණය(ඒකක) |
|---|---|---|
| 12 | 6 | 26 |
| 10 | 10 | 20 |
| 8 | 14 | 14 |
| 6 | 18 | 08 |
| 4 | 22 | 02 |
| 2 | 26 | -04 |

මෙම ලේඛනය අනුව අදාල භාණ්ඩයේ සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතාවය කොපමණද?

(1) -0.42 (2)-1.00 (3)-1.14 (4)-1.71 (5)-1.31

14. මයික්‍රොසොෆ්ට් මෘදුකාංග සඳහා අනම්‍ය ඉල්ලුමක් පැවතීමට බලපාන හේතුවක් වන්නේ,

(1) සලකා බලන භාණ්ඩය පටු ලෙස නිර්වචනය කර තිබීම.
(2) භාණ්ඩය සඳහා ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් වියදම් කොට තිබීම.
(3) භාණ්ඩය සඳහා ඇති ආදේශක සාපේක්ෂව පහත් මට්ටමක තිබීම
(4) සලකා බලන භාණ්ඩයෙන් ලැබෙන ප්‍රයෝජන සංඛ්‍යාව වැඩි වීම.
(5) භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයක් වීම. (..................)

15. සරල රේඛීය සැපයුම් වක්‍රය $Qs = -10+6p$ වන භාණ්ඩයක වෙළඳ මිල රු.10 දී ඉල්ලුම් නම්‍යතාව -0.3 කි. මෙම භාණ්ඩයේ අලෙවි ඒකකයක් මත රජය රු.3.00ක සහනාධාරයක් ලබා දෙන්නේ නම් පාරිභෝගිකයා ලබන ඒකක වාසිය කොපමණද?

(1) රු.2.00 (2) රු.0.60 (3) රු.1.80 (4) රු.2.40 (5) රු.1.60 (..................)

16. සමතුලිතතාවයේ පවතින භාණ්ඩයක් මත රජය සරල අවම මිල ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමක ප්‍රතිඵලයක් විය හැක්කේ,

| | මිල | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදක අතිරික්තය |
|---|---|---|---|
| (1) | අඩු වේ | අඩු වේ | වැඩි වේ |
| (2) | අඩු වේ | වැඩි වේ. | වැඩි වේ. |
| (3) | වැඩි වේ. | අඩුවේ | අඩු වේ |
| (4) | වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | අඩු වේ | වැඩි වේ. |

(..................)



Scanned by CamScanner

17. පහත සඳහන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ඔබට සපයා ඇත.

$$Q_d = 300 - 3p$$

$$Q_s = -30 + 2p$$

මෙම භාණ්ඩයේ සමතුලිත මිලේ දී පාරිභෝගික අතිරික්තය කොපමණ ද?

(1) රු.1264 කි. (2) රු.1734 කි. (3) රු.2128 කි. (4) රු.2364 කි. (5) රු.2592 කි. (..........)

18. තරඟකාරී වෙළඳ පොළක අලෙවි වන කිසියම් භාණ්ඩයක් සඳහා පවතින ඉල්ලුම ද සැපයුම ද වැඩි වන්නේ නම්,

(1) සමතුලිත මිල අඩු වී සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(2) සමතුලිත මිල අඩු වී සමතුලිත ප්‍රමාණය අඩු වේ.
(3) සමතුලිත මිල වෙනස් වන ආකාරයට අවිනිශ්චිතය . එහෙත් සමතුලිත ප්‍රමාණය වැඩි වේ.
(4) සමතුලිත ප්‍රමාණය වෙනස් වන ආකාරය අවිනිශ්චිතය . එහෙත් සමතුලිත මිල වැඩි වේ
(5) සමතුලිත මිල වෙනස් වන ආකාරය අවිනිශ්චිතය . එහෙත් සමතුලිත ප්‍රමාණය අඩු වේ. (..........)

19. කිසියම් භාණ්ඩයක් ඒකක 100ක් රු.5 බැගින් වූ මිලකට අලෙවි කළ හැකි විණි. අදාල භාණ්ඩයේ මිල රු.6.00 දක්වා වැඩි වීම හේතු කොට ගෙන මුළු අයභාරය 8%කින් වැඩි විය. මෙම භාණ්ඩ සඳහා වන මිල ඉල්ලුම් නම්‍යතාව පිහිටවන්නේ පහත කවර පරාසය තුළ ද?

(1) 0.4ට වඩා අඩු ය. (2) 0.4ට වඩා වැඩි ය. (3) 0.8ත් 1.2ත් අතර
(4) 1.2ට වඩා වැඩි (5) 1ට සමානයි. (..........)

20. කිසියම් භාණ්ඩයක් බාල භාණ්ඩයක් වීම සඳහා එම භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාව

(1) පූර්ණ අනම්‍ය විය යුතුය (2) එකට වඩා අඩුවිය යුතුය (3) එකට සමාන විය යුතුය
(4) ශුන්‍යයට සමානවිය යුතුය. (5) සෘණ අගයක් ගත යුතුය. (..........)

21. පූර්ණ තරඟකාරී වෙළඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයකට අදාල පහත තොරතුරු සැලකිල්ලට ගන්න.

| | |
|---|---|
| ඒකකයක මිල | රු.24.00 |
| නිෂ්පාදන ප්‍රමාණය | ඒකක 300 |
| අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය | රු.16.00 |
| සාමාන්‍ය ස්ථාවර පිරිවැය | රු.20.00 |

මෙම භාණ්ඩයේ ඒකකයක වෙළඳපොළ මිල රු 12.00ක් වූව හොත් වෙළඳ පොළ සැපයුම් ඒකක

(1) 200 (2) 80 (3) 30 (4) 20 (5) 0 (..........)

22. ප්‍රාමාණික ලාභය පිරිවැයක් ලෙස සැලකෙන්නේ,

(1) ගිණුම්කරණ ලාභයේ සංරචකයක් බැවිනි
(2) නිෂ්පාදනයේ විචල්‍ය පිරිවැයේ සංරචකයක් බැවිනි.
(3) සෘජු පිරිවැයේ සංරචකයන් බැවිනි.
(4) ව්‍යවසායකයන්ගේ කාර්යය වෙනුවෙන් කළයුතු ගෙවීමක් බැවිනි.
(5) මුදල්මය පිරිවැයෙන් ඉවත් කළ යුතු බැවිනි. (..........)


23. පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් දිගුකාලයේ දී ප්‍රශස්ත ධාරිතා මට්ටමේ සමතුලිතව කටයුතු කරන විට සාමාන්‍ය අයභාරය , ආන්තික පිරිවැයට සමාන වේ නම් ආයතනය.

(1) ආර්ථික ලාභ උපයමින් සිටී.
(2) ආර්ථික අලාභ උපයමින් සිටී
(3) ප්‍රාමාණික ලාභ උපයමින් සිටී.
(4) ආර්ථික ලාභ උපරිම වේ.
(5) ආර්ථික අලාභ උපරිම වේ. (..........)



Scanned by CamScanner

24. පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක මුළු පිරිවැය වක්‍රය (TC) සහ මුළු විචල්‍ය පිරිවැය වක්‍රය (TVC) පහත රූප සටහනේ දැක් වේ.




ආයතනයේ නිමවුම් ඒකක 20 දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය රු. 40ක් නම් සාමාන්‍ය ස්ථාවර පිරිවැය,

(1) ශුන්‍ය වේ (2) රු. 64.00 (3) රු. 20.00 (4) රු. 24.00 (5) රු. 40.00 (..........)

25. ඒකාධිකාරය පූර්ණ තරගයෙන් වෙනස් වන්නේ,
(1) නව ආයතනවලට ඇතුළුවීමට බාධා නැති නිසා
(2) ඉන්ද්‍රිය සැපයුම් නිපදවීම නිසාය
(3) ආයතනයත් කර්මාන්තයත් දෙකම එකක් නිසා
(4) ආයතන කිහිපයක් පමණක් පවතින නිසා.
(5) ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ අනම්‍ය නිසා. (..........)

26. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් ව්‍යාපාර චක්‍ර සම්බන්ධයෙන් වඩාත්ම නිවැරදි ප්‍රකාශය තෝරාගන්න.
(1) සැබෑ නිමැවුම් මට්ටම, විභව නිමැවුම් මට්ටම ඉක්මවා ගිය විට ප්‍රතිගාමිත්ව පරතරයක් ඇති වේ.
(2) එකම ව්‍යාපාර චක්‍රයක මුදුනත් අතර දිග එකිනෙකට සමාන වේ.
(3) විභව නිමැවුම් මට්ටම සැබෑ නිමැවුම් මට්ටම ඉක්මවා ගිය විට එය සෘණ පරතරයකි.
(4) සැබෑ නිමැවුමෙන් සමස්ත ආර්ථිකයේ දිගු කාලීන ගමන් මග නිරූපනය කරයි.
(5) ධන නිමැවුම් පරතරයක දී සැබෑ නිමැවුම් මට්ටම විභව නිමැවුම් මට්ටමට වඩා වැඩි අගයක් ගනී (..........).

27. ගාස්තු අය කරමින් උසස් අධ්‍යාපන පහසුකම් ලබා දෙන විශ්ව විද්‍යාල පහත දැක්වෙන කවර ආයතනික ඒකකයට අයත් වේ ද?
(1) මූල්‍ය සමාගම් (2) මූල්‍ය නොවන සමාගම් (3) කුටුම්බ අංශය
(4) අර්ධ සමායතන (5) ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්බ සඳහා සේවා සපයන ආයතන (..........)

28. ජාතික ගිණුම්කරණයේ දී නිමැවුම අගය කිරීමට යොදා ගනු ලබන මූලික මිලෙහි අන්තර්ගත වනුයේ,
(1) නිෂ්පාදන ක්‍රියාවලිය මත අය කරන බදු
(2) ප්‍රවාහන ගාස්තු
(3) නිෂ්පාදන ක්‍රියාවලිය මත ලබා දෙන සහනාධාර
(4) නිෂ්පාදිත මත අය කරන බදු
(5) නිෂ්පාදිත මත ලබා දෙන සහනාධාර (..........)

29 එක්තරා ආර්ථිකයකට අදාලව තොරතුරු පහත ලබා දී ඇත. ඒ අනුව එම වර්ෂයේ ස්ථාවර මිලට දළ දේශීය නිමැවුම් වටිනාකම කොපමණ ද ? (සංඛ්‍යා රු. මිලියන වලින්)

| | |
|---|---|
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 800 |
| නිෂ්පාදිත මත ලබා දුන් මුළු සහනාධාර | 4,200 |
| සමස්ත දළ එකතු කළ අගය (මූලික මිලට) | 66,000 |
| නිෂ්පාදිත මත අය කළ බදු | 7,100 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගමන අවධමනකය | 130 |

(1) රු.මි.82,030 (2) රු.මි.53,000 (3) රු.මි.52,385 (4) රු.මි. 54,690 (5) රු.මි.89,570 (..........)



www.alsciencepapers.blogspot.com


Scanned by CamScanner

30. SNA 2008 ආදායම් ප්‍රවේශය අනුව ජාතික ආදායම් ගණනය කිරීමේ දී ශුද්ධ මෙහෙයුම් අතිරික්තයට ඇතුළත් කරනුයේ,
(1) නිෂ්පාදනය නොකළ වත්කම් හිමිකරුවන්ට ගෙවන බදු කුලී
(2) සමාගම් නොවන ව්‍යවසායන් ජනනය කරන ආදායම්
(3) විශ්‍රාම ගැනීමේ දී සේවා යෝජකයා විසින් සෘජුව ලබා දෙන අර මුදල්
(4) සේවකයා ලබා දෙන සමාජ ආරක්ෂණ දායක මුදල්
(5) සේවා යෝජකයා සේවකයාගේ දරුවන් වෙත ලබා දෙන ශිෂ්‍යාධාර දීමනා. (..................)

31. යම් වර්ෂයක දී රටක දළ දේශීය වියදම්, දළ දේශීය නිෂ්පාදිතයට වඩා අඩු නම්, එම වර්ෂයේ දී,
(1) වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් පවතී.
(2) ශුද්ධ වක්‍ර බදු සෘණ අගයකි.
(3) ප්‍රාග්ධන ක්ෂයවීම අධික වේ.
(4) ශුද්ධ අපනයන සෘණ අගයකි.
(5) ශුද්ධ වක්‍ර බදු ධන අගයකි. (..................)

32. එළවළු වගා කරන ගොවියකු තම මූල්‍ය ධනය යොදා ගෙන එළවළු නිපදවා එය රු.16000කට තොග වෙළෙන්දාට අලෙවි කරයි. තොග වෙළෙන්දා එම එළවළු තොගය රු.20000කට සිල්ලර වෙළෙන්දාට එය අලෙවි කරන අතර සිල්ලර වෙළෙන්දා එය රු 26000කට පාරිභෝගිකයාට විකුණා දමයි. මෙම නිෂ්පාදන ක්‍රියාවලියේ මුළු එකතු කළ අගය වන්නේ,
(1) රු.1000කි. (2) රු.4000කි. (3) රු.6000කි. (4) රු.26000කි. (5) රු.20000කි. (..................)

33. ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය පහත දැක්වෙන පරිදි $C_1$ සිට $C_2$ දක්වා වෙනස් වී ඇත.




www.alsciencepapers.blogspot.co

මෙම වෙනස් වීම ආර්ථිකයේ ස්වායත්ත වියදම් ගුණකය සහ ආන්තික ඉතුරුම් නැඹියාව මත ඇති කරන බලපෑම කෙබඳුද?

| ගුණකය | ආන්තික ඉතුරුම් නැඹියාව |
|---|---|
| (1) අඩු වේ | අඩු වේ |
| (2) වැඩි වේ | අඩු වේ |
| (3) අඩු වේ | වැඩි වේ |
| (4) වෙනස් නොවේ. | අඩු වේ |
| (5) වැඩි වේ | වැඩි වේ |

(..................)

34. ආර්ථිකයක සමතුලිත නිමැවුම් මට්ටමේ දී බදු රු.බි.200ක් ද, ආයෝජනය රු.බි.350ක් ද, රජයේ මිල දී ගැනීම් රු.බි.460ක් ද, ආනයන රු.බි.400ක් ද, අපනයන රු.බි.290ක් ද, ස්වායත්ත පරිභෝජන වියදම රු.බි.700ක් ද, වියදම් කළ හැකි ආදායම රු.බි.6000ක් ද වේ. මෙම ආර්ථිකයේ ආන්තික පරිභෝජන නැඹියාව වන්නේ,

(1) 0.2 (2) 0.6 (3) 0.4 (4) 0.8 (5) 0.66 (..................)


35. එක්තරා ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 75 + 0.75yd වේ. රජය විසින් වියදම් රු.බි 200කින් ඉහළ දැමීමක් බදු රු.බි. 150කින් පහළ දැමීමක් එකවර සිදු කළ හොත්,
(1) සමස්ත නිමැවුම රු.බි. 50 කින් ඉහළ යයි.
(2) සමස්ත නිමැවුම රු.බි. 200 කින් ඉහළ යයි.
(3) සමස්ත නිමැවුම රු.බි. 450 කින් පහළ යයි.
(4) සමස්ත නිමැවුම රු.බි. 350 කින් ඉහළ යයි.
(5) සමස්ත නිමැවුම රු.බි. 1250 කින් ඉහළ යයි. (..................)



Scanned by CamScanner

36. පරිභෝජන ශ්‍රිතය හා ඉතුරුම් ශ්‍රිතය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
   (1) සාමාන්‍ය පරිභෝජන නැඹියාවේ සහ ආන්තික පරිභෝජන නැඹියාවේ එකතුව සැමවිටම 1ට සමාන වේ.
   (2) වැය කළ හැකි ආදායම ඉහළ යන විට සාමාන්‍ය පරිභෝජන නැඹියාව පහළ යයි.
   (3) ස්වාධීන පරිභෝජන මට්ටමේ දී ඉතුරුම් වටිනාකම හැම විටම සෘණ අගයක් ගනියි.
   (4) පරිභෝජන රේඛාව හැම විටම මූල ලක්ෂ්‍යයෙන් ආරම්භ වේ.
   (5) ආන්තික ඉතුරුම් නැඹියාව එකක් වන විට ආදායම හා පරිභෝජනය එකිනෙකට සමාන වේ. (.....1.....)

37. පහත රූප සටහනේ පූර්ණ සේවා නියුක්ති මට්ටම Yf නම් සේවා වියුක්ති පරතරය දැක්වෙන්නේ,
   (1) $O-Y_1$ (2) b-c (3) $Y_1-Yf$ (4) $Y_1-Y_2$ (5) $Yf-Y_2$




(.....1.....)

38. ආර්ථිකයක පොදු මිල මට්ටමේ සිදු වන ඉහළ යාමක් නිසා,
   (1) මුදලේ අභ්‍යන්තර අගය පහළ යයි
   (2) මුදලේ සංසරණ ප්‍රවේගය පහළ යයි.
   (3) ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පෙළඹේ
   (4) මුදලේ වටිනාකම ඉහළ යයි.
   (5) ආර්ථික වර්ධනය හා සේවා වියුක්තිය ඉහළ යයි. (.....1.....)

39. කේන්සියානු විග්‍රහයට අනුව උද්ධමනයට බලපාන මූලික සාධකය වන්නේ,
   (1) සැපයුම් කම්පන හේතුවෙන් ඇතිවන සමාහාර සැපයුමේ පහළ යාමක්
   (2) සංසරණ ප්‍රවේගය ඉහළ යාම නිසා ඇති වන පොදු මිල මට්ටමේ ඉහළ යාමක්
   (3) පූර්ණ සේවා නියුක්ති නිමවුම ළඟා කර ගැනීමෙන් පසුව සිදුවන සමාහාර ඉල්ලුමේ ඉහළ යාමක්
   (4) ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් ඇති වන මුදල් සැපයුමේ වර්ධනයක්.
   (5) නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා ඇති වන සැපයුමේ පහළ යාමක් (.....2.....)

40. රු.මිලියන 500ක මුදල් සැපයුමක් නිෂ්පාදිතය මිලදී ගැනීම සඳහා දෙවරක් අතින් අතට හුවමාරු වූ විට දී,
   (1) මුදල් සැපයුම මෙන් 20 ගුණයකින් සමාහාර ඉල්ලුම ඉහළ යයි.
   (2) ආර්ථිකයේ මූර්ත නිෂ්පාදිතයේ වටිනාකම රු.බිලියන 1000ක් වේ.
   (3) පොදු මිල මට්ටම නොවෙනස්ව තිබිය දී මූර්ත නිමවුම ඉහළ යයි.
   (4) ආර්ථිකයේ නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම රු.බිලියන 1000ක් වේ.
   (5) ආර්ථිකයේ මිල මට්ටම ද දෙගුණ වේ. (.....4.....)

41. තාවකාලික හුවමාරු මාධ්‍යක් ලෙස යොදා ගත හැකි දෑ හඳුන්වනු ලබන්නේ කෙසේ ද?
   (1) බැංකු මුදල් (2) මුදල් ආදේශක (3) ව්‍යවහාර මුදල්
   (4) ආසන්න මුදල් (5) අධි බලැති මුදල්. (.....2.....)

42. පහත දෑ අතුරින් මුදල් වෙළඳ පොළ තුළ භාවිතා වන මූල්‍ය උපකරණය කුමක් ද?
   (1) භාණ්ඩාගාර බැඳුම්කර (2) භාණ්ඩාගාර බිල්පත් (3) ව්‍යාපාර කොටස්
   (4) ණයකර (5) ඒකක භාර (.....3.....)



Scanned by CamScanner

43. වාණිජ බැංකුවක ව්‍යවස්ථාපිත සංචිතය කොතනට ඇතුලත් වන්නේ,
(1) වාණිජ බැංකු අතැති මුදල් ය.
(2) වාණිජ බැංකු අතැති මුදල් සහ මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතුය
(3) වාණිජ බැංකු අතැති මුදල් සහ රජයේ සුරැකුම්පත්වල කරනු ලබන ආයෝජනය
(4) මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ව්‍යවස්ථාපිත තැන්පතු ය.
(5) මහජන වාණිජ බැංකු වලින් ආපසු ගත් මුදල් සහ වාණිජ බැංකු අතැති මුදල් ය. (..........)

44. එක්තරා කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම ($M_1$) රු.බි.4200 ක් ද, මූල බැංකු තැන්පතු ප්‍රමාණය රු.බි.3000ක් ද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් ද වේ. වාණිජ බැංකු විසින් අධි සංචිත පවත්වා නොගන්නේ නම්, මෙම ආර්ථිකයේ මුදල් ගුණකය වන්නේ,
(1) 3.5 (2). 1.4 (3). 14 (4).4 (5) 2.8 (..........)

45. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 25% වන බැංකු පද්ධතියක් තුළ පුද්ගලයකු විසින් රු.2000ක මුදලක් තැන්පත් කරන ලදී. වාණිජ බැංකු විසින් අධි සංචිත පවත්වා නොගන්නේ නම්, මෙම තැන්පතුවේ ප්‍රතිඵලයක් ලෙස බැංකු පද්ධතිය තුළ මූල තැන්පතු ප්‍රමාණය හා ආර්ථිකයේ නව මුදල් සැපයුම කොපමණ වේ ද?

| මූල තැන්පතු ප්‍රමාණය | නව මුදල් සැපයුම |
|---|---|
| (1) රු.8000 | රු.10,000 |
| (2) රු.8000 | රු.8000 |
| (3) රු.1950 | රු.2000 |
| (4) රු.2000 | රු.2000 |
| (5) රු.2000 | රු.3950 |

(..........)

46. අනෙකුත් සාධක ස්ථාවරව පවතින විටක දී, මුදල් සැපයුමේ ඉහළ යාමකට හේතුවන්නේ,
(1) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ ඉහළ යාමක්
(2) මුදල් සඳහා පවතින ඉල්ලුමේ පහළ යාමක්
(3) බැංකු පද්ධතිය මඟින් රජයට සපයන ණය සීමා කිරීමක්
(4) මහ බැංකුව විසින් බැංකු පොලී අනුපාතිකය ඉහළ දැමීමක්
(5) බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශ වත්කම් ඉහළ යාමක් (..........)

47. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ඉලක්ක විචල්‍යයන් වන්නේ,
(1) බදු සහ රජයේ වියදම (2) මුදල් සැපයුම හා පොලී අනුපාත (3) රජයේ වියදම හා ආර්ථික වර්ධනය
(4) බදු සහ නිමැවුම මට්ටම (5) රජයේ වියදම හා සේවා නියුක්තිය (..........)

48. වෙළඳ පොළ අසාර්ථක වීමකට උදාහරණයක් වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය මඟින් ශුභ සාධන භාණ්ඩ සැපයීම.
(2) රටකට විදේශ ආධාර ලැබීම.
(3) රජය මඟින් පොදු භාණ්ඩ සැපයීම.
(4) ආදායම් ව්‍යාප්තිය තුළ විෂමතා හට ගැනීම
(5) ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ආර්ථිකයේ මිල ස්ථායීතාව පවත්වාගෙන යාම. (..........

49. පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා සමාජ ප්‍රතිලාභ දක්නට ලැබෙන්නේ කුමන භාණ්ඩයක් සම්බන්ධයෙන් ද?
(1) අවගුණ භාණ්ඩ (2) ආර්ථික භාණ්ඩ (3) අර්ධ පොදු භාණ්ඩ
(4) ශුභ සාධන භාණ්ඩ (5) පොදු භාණ්ඩ (..........

50. පොදු භාණ්ඩ , අර්ධ පොදු භාණ්ඩ, පොදු දේපල සම්පත් සඳහා උදාහරණ පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,
(1) පරිසරය , අධිවේගී මාර්ග , ඕසෝන් ස්ථරය (2) පාසල් , පුස්තකාල , මත්ස්‍ය සම්පත
(3) ප්‍රදීපාගාර , පිහිනුම් තටාක , පොදු තණ බිම් (4) මහා මාර්ග , වනාන්තර , මත්ස්‍ය සම්පත
(5) රෝහල් , පාසල් , උද්‍යාන (..........



Scanned by CamScanner

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

## TOP CATEGORIES

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00